**European Union**

# මාධ්‍ය නිවේදනය

## යුරෝපා සංගමයේ ප්‍රති-ත්‍රස්ත කටයුතු සම්බන්ධීකාරක ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ සංචාරයක

කොළඹ, 2019 ජූලි 10–යුරෝපා සංගමයේ ප්‍රති-ත්‍රස්ත කටයුතු සම්බන්ධීකාරක ජිල් ද කෙයශොව් (Gilles de Kerchove) මහතා 2019 ජූලි 11 දින සිට ජූලි 16 දින දක්වා ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ සංචාරයක නිරත වේ. මෙම රටවල් දෙකෙහි ආරක්ෂාව තරකිරීමේ උත්සාහයන්ට සහ අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා වඩාත් සුදුසු පසුබිමක් නිර්මාණය කරගැනීමේ උත්සාහයන්ට අත්වැලක් වීම මෙම සංචාරයේ අරමුණයි.

ශ්‍රී ලංකාව තුළදී කෙයශොව් මහතා රජයේ, විපක්ෂයේ සහ ආරක්ෂක අංශ වල ප්‍රධාන පෙළේ නියෝජිතයන් සහ සිවිල් සමාජයේ නියෝජිතයන් හමුවනු ඇත.

මාලදිවයිනේදී ඒ මහතා අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කිහිපයක් පවත්වනු ඇති අතර, ආරක්ෂක අංශ වල නිලධාරීන් සමගද සාකච්ඡා පැවැත්වීමට නියමිත ය.

තවද කෙයශොව් මහතා ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව හමුවනු ඇත.

ජිල් ද කෙයශොව් මහතා 2007 වසරේ සිට යුරෝපා සංගමයේ ප්‍රති-ත්‍රස්ත කටයුතු සම්බන්ධීකාරකවරයා ලෙස කටයුතු කරයි. ලෝවන් හි කතෝලික විශ්ව විද්‍යාලය, බ්‍රසල් හි නිදහස් විශ්ව විද්‍යාලය සහ බ්‍රසල්ස් හි ශාන්ත ලුවිස් විශ්ව විද්‍යාලය යන විශ්ව විද්‍යාල වල යුරෝපා නීතිය ඉගැන්වීමෙහි නියුතු ඒ මහතා යුරෝපා නීතිය, මානව හිමිකම්, ආරක්ෂාව සහ ප්‍රති-ත්‍රස්ත කටයුතු සම්බන්ධයෙන් ලිපි සහ ග්‍රන්ථ බොහොමයක් ප්‍රකශනයට පත් කර ඇත.

END

විස්තර සඳහා:

Political, Trade and Communications Section
Delegation of the European Union to Sri Lanka and the Maldives
Tel: + 94 11 2674413-4